# සවිස්තරාත්මක තත්ත්ව වාර්තා සාරාංශය

(දිනය - 2025.11.30 වේලාව - 1800)

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

## 2025.11.16 දින 0600 පැය සිට 2025.11.30 දින 1800 පැය දක්වා සමස්ථ තත්ත්ව වාර්තාව

| අ.අ | දිස්ත්‍රික්කය | බලපෑමට ලක්වූ පවුල් | බලපෑමට ලක්වූ පුද්ගලයින් | මිය යෑම් | අතුරුදහන් | ආරක්ෂිත ස්ථාන සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | පුද්ගලයින් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | පුත්තලම | 36,098 | 135,922 | | 2 | 59 | 3,007 | 11,221 |
| 2 | බදුල්ල | 7,973 | 32,760 | 71 | 53 | 180 | 5,524 | 22,373 |
| 3 | මොණරාගල | 968 | 3,346 | 3 | 1 | 5 | 136 | 347 |
| 4 | මාතලේ | 2,955 | 10,335 | 23 | 7 | 48 | 3,142 | 10,776 |
| 5 | කොළඹ | 52,939 | 218,123 | 3 | 2 | 104 | 5,303 | 16,934 |
| 6 | මඩකලපුව | 12,466 | 34,380 | 2 | | 3 | 37 | 1,609 |
| 7 | කෑගල්ල | 8,031 | 30,336 | 12 | 46 | 132 | 3,225 | 12,422 |
| 8 | ත්‍රිකුණාමලය | 18,734 | 60,458 | - | | 34 | 2,838 | 8,252 |
| 9 | අනුරාධපුර | 9,143 | 30,703 | 5 | 2 | 72 | 2,497 | 9,399 |
| 10 | මුලතිව් | 1,550 | 4,592 | 1 | - | 102 | 1,410 | 3,848 |
| 11 | කිලිනොච්චි | 7,802 | 22,600 | | | 30 | 1,447 | 4,134 |
| 12 | අම්පාර | 6,445 | 21,164 | 8 | | 12 | 649 | 1,486 |
| 13 | යාපනය | 1,669 | 5,283 | 3 | 2 | 57 | 1,619 | 5,323 |
| 14 | පොලොන්නරුව | 7,449 | 24,845 | 2 | | 29 | 3,472 | 11,598 |
| 15 | නුවර | 10,873 | 36,765 | 88 | 150 | 176 | 5,001 | 20,064 |
| 16 | රත්නපුර | 11,579 | 45,769 | | | 55 | 608 | 2,102 |
| 17 | කුරුණෑගල | 13,634 | 46,268 | 37 | 35 | 94 | 2,257 | 7,970 |
| 18 | නුවරඑළිය | 2,895 | 6,472 | 68 | 64 | 56 | 1,186 | 4,726 |
| 19 | මාතර | 355 | 1,329 | | | - | - | - |
| 20 | හම්බන්තොට | 818 | 2,619 | | | - | - | - |
| 21 | ගාල්ල | 368 | 1,226 | 1 | | - | - | - |
| 22 | කළුතර | 2,013 | 7,093 | | | 7 | 111 | 416 |
| 23 | මන්නාරම | 24,313 | 79,946 | | | 87 | 5,273 | 16,554 |
| 24 | ගම්පහ | 62,728 | 236,498 | 5 | 4 | 104 | 4,965 | 18,190 |
| 25 | වවුනියාව | 5,809 | 20,097 | 2 | 2 | 48 | 2,040 | 7,046 |
| එකතුව | | **309,607** | **1,118,929** | **334** | **370** | **1,494** | **55,747** | **196,790** |

| සමස්ථ ආපදා විස්තරය **Island-wide Total Incidents Summary** | සංඛ්‍යාව |
|---|---|
| ▪ **බලපෑමට ලක් වූ මුළු පවුල් සංඛ්‍යාව** | 309,607 |
| ▪ **බලපෑමට ලක් වූ මුළු පුද්ගල සංඛ්‍යාව** | 1,118,929 |
| ▪ **මියයෑම** | 334 |
| ▪ **අතුරුදහන්** | 370 |
| ▪ **සුරක්ෂිත මධ්‍යස්ථාන සංඛ්‍යාව** | 1,494 |
| ▪ **සුරක්ෂිත මධ්‍යස්ථානයන්හි සිටින මුළු පවුල් සංඛ්‍යාව** | 55,747 |
| ▪ **සුරක්ෂිත මධ්‍යස්ථානයන්හි සිටින මුළු පුද්ගල සංඛ්‍යාව** | 196,790 |

- මෙම වාර්ථාව දිස්ත්‍රික් ඒකකයන් වෙතින් දැනට ලැබී ඇති තොරතුරු මත සකස් කරන ලද්දකි. මේ වන විටත් නව තොරතුරු සහ ලැබී ඇති තොරතුරු යාවත්කාලීන වෙමින් පවතී.

| මරණ පිළිබඳ විස්තර (2025.11.26 දින සිට 2025.11.30 දින 1800 පැය දක්වා) | | | |
|---|---|---|---|
| අනු අ.කය | දිස්ත්‍රික්කය | ආපදාව | මරණ ප්‍රමාණය |
| 01 | බදුල්ල | නාය යෑම්<br>පස්කඳු කඩා වැටීම්<br>ගංවතුර<br>ජලගැලීම්<br>දියේ ගිලීම් | 71 |
| 02 | මොණරාගල | | 3 |
| 03 | මාතලේ | | 23 |
| 04 | කොළඹ | | 3 |
| 05 | මඩකලපුව | | 2 |
| 06 | කෑගල්ල | | 12 |
| 07 | අනුරාධපුර | | 5 |
| 08 | මුලතිව් | | 1 |
| 09 | අම්පාර | | 8 |
| 10 | යාපනය | | 3 |
| 11 | පොලොන්නරුව | | 2 |
| 12 | මහනුවර | | 88 |
| 13 | කුරුණෑගල | | 37 |
| 14 | නුවරඑළිය | | 68 |
| 15 | ගාල්ල | | 1 |
| 16 | ගම්පහ | | 5 |
| 17 | වවුනියාව | | 2 |
| එකතුව | | | 334 |

| සුරක්ෂිත මධ්‍යස්ථාන පිළිබඳ විස්තර (2025.11.30 දින 1800 පැය දක්වා) | | | | |
|---|---|---|---|---|
| අ.අ | දිස්ත්‍රික්කය | ආරක්ෂිත ස්ථාන සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | පුද්ගලයින් සංඛ්‍යාව |
| 1 | පුත්තලම | 59 | 3,007 | 11,221 |
| 2 | බදුල්ල | 180 | 5,524 | 22,373 |
| 3 | මොණරාගල | 5 | 136 | 347 |
| 4 | මාතලේ | 48 | 3,142 | 10,776 |
| 5 | කොළඹ | 104 | 5,303 | 16,934 |
| 6 | මඩකලපුව | 3 | 37 | 1,609 |
| 7 | කෑගල්ල | 132 | 3,225 | 12,422 |
| 8 | ත්‍රිකුණාමලය | 34 | 2,838 | 8,252 |
| 9 | අනුරාධපුර | 72 | 2,497 | 9,399 |
| 10 | මුලතිව් | 102 | 1,410 | 3,848 |
| 11 | කිලිනොච්චි | 30 | 1,447 | 4,134 |
| 12 | අම්පාර | 12 | 649 | 1,486 |
| 13 | යාපනය | 57 | 1,619 | 5,323 |
| 14 | පොලොන්නරුව | 29 | 3,472 | 11,598 |
| 15 | නුවර | 176 | 5,001 | 20,064 |
| 16 | රත්නපුර | 55 | 608 | 2,102 |
| 17 | කුරුණෑගල | 94 | 2,257 | 7,970 |
| 18 | නුවරඑළිය | 56 | 1,186 | 4,726 |
| 19 | මාතර | - | - | - |
| 20 | හම්බන්තොට | - | - | - |
| 21 | ගාල්ල | - | - | - |
| 22 | කළුතර | 7 | 111 | 416 |
| 23 | මන්නාරම | 87 | 5,273 | 16,554 |
| 24 | ගම්පහ | 104 | 4,965 | 18,190 |
| 25 | වවුනියාව | 48 | 2,040 | 7,046 |
| එකතුව | | **1,494** | **55,747** | **196,790** |

**2025.11.30 දින 0600 පැය සිට 2025.11.30 දින 1900 පැය දක්වා විශේෂ සිදුවීම්**

**පුත්තලම දිස්ත්‍රික්කය**

- ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ බෙල් 212 වර්ගයේ හෙලි යානාවක් පුත්තලම ලුණුවිල ප්‍රදේශයේදී අනතුරට පත්ව ඇත. ගුවන්නියමුවන් ඇතුළුව පස්දෙනෙකු තුවාල ලබා මාරවිල රෝහලට ඇතුලත් කර ඇත.

- ජලගැලීම් හේතුවෙන් ආරච්චිකට්ටුව ප්‍රා.ලේ. මරණ 03ක් හා කරුවලගස්වැව ප්‍රා.ලේ. මරණ 01ක් වාර්තා වන බව පුත්තලම දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකයෙන් දන්වන ලදි.

**කොළඹ දිස්ත්‍රික්කය**

- දහම්වෙල පාර, කොහිලවත්ත, කොටිකාවත්ත ලිපනය සහිත ප්‍රදේශයේ පුද්ගලයින් 20ක් ජලගැලීම් හේතුවෙන් කොටු වූ සිටි අතර කොළඹ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකයේ සම්බන්ධීකරණයෙන් ඔවුන් මුදවා ගැනීමට මුදවා ගැනීම් කණ්ඩායම් යොමු කරන ලදි.

- මුල්ලේරියාව, අංගොඩ වාගෝන් රිවර් සයිඩ් හෝටලයේ පුද්ගලයින් 20ක් ජලගැලීම් හේතුවෙන් කොටු වූ සිටි අතර කොළඹ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකයේ සම්බන්ධීකරණයෙන් ඔවුන් මුදවා ගැනීමට මුදවා ගැනීම් කණ්ඩායම් යොමු කරන ලදි.

- හංවැල්ල ප්‍රදේශයේ අධි අවධානම් ස්ථානයක සිටි වැඩිහිටියන් 26 දෙනෙකු සහ ළමුන් 04 දෙනෙකු නාවික හමුදා මැදිහත් වීමෙන් ආරක්ෂිත ස්ථානයක් වෙත යොමු කිරීමට කටයුතු කර ඇත.

- කඩුවෙල පොලිස් ස්ථානය සහ අවට ජනතාව මුදවා ගැනීම වෙනුවෙන් කොළඹ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකය සම්බන්ධීකරණයෙන් නාවික හමුදා බෝට්ටු 04ක් යොමු කිරීමට කටයුතු කරන ලදී.

**කුරුණෑගල දිස්ත්‍රික්කය**

- මැල්සිරිපුර, මඩල්පොල කන්ද නාය ගොස් පුද්ගලයින් 200ක් පමණ යට වී ඇති බව තොරතුරු වාර්ථා වූ අතර, මේ පිළිබඳ කුරුණෑගල නියෝජ්‍ය අධ්‍යක්ෂතුමාගෙන් එය තහවුරු කර ගන්නා ලදී. මේ වන විට එම ස්ථානයේ යට වී ඇති පිරිස නිශ්චිතව සඳහන් කල නොහැකි බවත් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බවත් කුරුණෑගල නියෝජ්‍ය අධ්‍යක්ෂ විසින් දන්වන ලදී. මේ සම්බන්ධයෙන් තොරතුරු වාර්ථා වූ පසුව දැනුම් දෙන බවද සඳහන් කරන ලදී.
- මැල්සිරිපුර ප්‍රා.ලේ., ගුරත්න 416 ග්‍රා.නි. වසමේ, මැල්සිරිපුර පොලිස් වසමේ, කඳුමුල්ල නාය යාමෙන් පුද්ගලයින් 5 දෙනෙකු මිය ගොස් ඇති අතර අතුරුදන් පුද්ගලයින් සොයා මැල්සිරිපුර පොලීසිය සහ යුධ හමුදා තව දුරටත් මෙහෙයුම් සිදු කරන අතර පුද්ගලයින් 164 දෙනෙකු ආරක්ෂිතව ඉවත් කොට සුරක්ෂිත මධ්‍යස්තාන වෙත යොමු කිරීමට කටයුතු යොදා ඇත.

**කෑගල්ල දිස්ත්‍රික්කය**

- වැලිවතුර ප්‍රදේශයේ කෝවිල් කන්ද නායගොස් පුද්ගලයින් පිරිසක් යටවී ඇති බවත් ඉන් පුද්ගලයින් පිරිසක් බේරාගන ඇති අතර සිරවී සිටින අනෙක් පුද්ගලයින් බේරාගැනීම සඳහා බෙරගල යුධ හමුදා කඳවුරේ හට පිරිස් තවදුරටක් ක්‍රියා නියුතු වී ඇත.
- මාවනැල්ල-කන්දවත්ත නාය යෑමට ලක්ව ඇති අතර මාවනැල්ල පොලිසිය සම්බන්ධිකරණයෙන් අදාල පිරිස් මුදවා ගැනීමට කටයුතු කර ඇත.
- වැලිවතුර-ඔව්විකන්ද නාය යෑමට ලක් වීමෙන් නිවාස 05ක් ආපදාවට ලක්ව ඇති අතර බෙරගල යුධ හමුදා කඳවුර සහ පොලීසිය සම්බන්ධීකරණයෙන් අදාල පිරිස් මුදවා ගැනීමට කටයුතු කර ඇත.
- මාවනැල්ල-කන්දවත්ත නාය යෑමට ලක්ව ඇති අතර මාවනැල්ල පොලිසිය සම්බන්ධිකරණයෙන් අදාල පිරිස් මුදවා ගැනීමට කටයුතු කර ඇත.
- වැලිවතුර-ඔව්විකන්ද නාය යෑමට ලක් වීමෙන් නිවාස 05ක් ආපදාවට ලක්ව ඇති අතර බෙරගල යුධ හමුදා කඳවුර සහ පොලීසිය සම්බන්ධීකරණයෙන් අදාල පිරිස් මුදවා ගැනීමට කටයුතු කර ඇත.

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

- මාවිල්ආරු ජලාශයේ වෙල්ල කඩාගෙන යාමේ දැඩි අවදානමක් පවතින අතර ඒ සම්බන්ධයෙන් මාධ්‍ය නිවේදන නිකුත් කොට රාජ්‍ය යාන්ත්‍රණය, දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්වරුන් සහ ග්‍රාම නිලධාරීන් දැනුවත් කොට ජනතාව ඉවත් කිරීමට කටයුතු කර ඇත.

**ගම්පහ දිස්ත්‍රික්කය**

- කොළඹ-නුවර ප්‍රධාන මාර්ගයේ යක්කල ආයුර්වේදය ඉදිරිපිට මාර්ගය ඉරිතලා ඇති බැවින් ගිලා බැසීමේ අවධානමක් තිබෙන බැවින් පැය 15ට මාර්ගය වසා තැබෙන බව ගම්පහ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකය මගින් දැනුම් දෙන ලදී.

මාතලේ දිස්ත්‍රික්කය

- අඹන්ගඟකෝරළේ ඉඟුරුවත්ත ග්‍රාම නිලධාරී වසමේ කරගහතැන්න කන්ද නාය යැමට ලක්ව ඇති අතර පුද්ගලයින් 390ක් පමණ ආපදාවට ලක්ව ඇත. මින් පුද්ගලයින් 350ක් පමණ යුධ හමුදාවේ 8 GR 1 X 20 යොදා ගනිමින් ආරක්ෂිතව මුදවා ගැනීමට කටයුතු කර ඇති අතර පුද්ගලයින් 40ක් පමණ (වයස සහ අසනීප තත්ත්ව හේතුවෙන්) සුරක්ෂිතව ඉවත් කිරීම සඳහා ගුවන් හමුදා සහය ලබා ගැනීමට මූලික කටයුතු සූදානම් කර ඇත.
- අඹන්ගඟකෝරළේ ඉඟුරුවත්ත ග්‍රාම නිලධාරී වසමේ කරගහතැන්න කන්ද නාය යැමට ලක්ව ඇති අතර පුද්ගලයින් 390ක් පමණ ආපදාවට ලක්ව ඇත. මින් පුද්ගලයින් 350ක් පමණ යුධ හමුදාවේ 8 GR 1 X 20 යොදා ගනිමින් ආරක්ෂිතව මුදවා ගැනීමට කටයුතු කර ඇති අතර පුද්ගලයින් 40ක් පමණ (වයස සහ අසනීප තත්ත්ව හේතුවෙන්) සුරක්ෂිතව ඉවත් කිරීම සඳහා ගුවන් හමුදා සහය ලබා ගැනීමට මූලික කටයුතු සූදානම් කර ඇත.

බදුල්ල දිස්ත්‍රික්කය

- ගංවතුරට හසුවීම හේතුවෙන් ධාවනයට සහ පරිහරණයට නුසුදුසු තත්ත්වයට පත් මහියංගන රෝහලේ ගිලන් රථ හා යන්ත්‍ර අලුත්වැඩියාවන් පලාත් යාන්ත්‍රික දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරු එරන්ද මහතාගේ නායකත්වය යටතේ කණ්ඩායමක් විසින් සිදු කරනු ලැබේ.

**මහවැලි ගඟ ද්‍රෝණිය සඳහා ගංවතුර අවදානම් නිවේදනය 2025.11.29 දින 1230 පැයට (2025.12.01 දින 1230 පැය දක්වා)**

| | |
|---|---|
| 2025.12.01 දින ප.ව 12.30 දක්වා වලංගුවේ.<br>Valid till 12.30 PM on 01st of December 2025 | **Time :- 12.30 PM**<br>**වේලාව :- ප.ව. 12.30** |

| | | | |
|---|---|---|---|
| **ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන :** | **අංක - 08** | වර්ණය - රතු | |
| **Flood Warning Message :** | **Number - 08** | Colour – Red | |

## අධි ගංවතුර අනතුරු ඇඟවීම - Critical Flood Warning

## මහවැලි ගඟ ද්‍රෝණිය පහළ නිම්නය - Lower Catchment of Mahaweli River Basin

මහවැලි ගඟෙහි ධාරා ප්‍රදේශවලට ලැබුණු අධික වර්ෂාපතනය සහ මහවැලි ගඟෙහි වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් නඩත්තු කරනු ලබන මනම්පිටිය ජලමාපකයේ අගයන් සලකා බැලීමේදී මහවැලි ගඟ **ද්‍රෝණියේ පහළ නිම්නයේ දිඹුලාගල, තමන්කඩුව, වැලිකන්ද, ලංකාපුර, මැදිරිගිරිය, සේරුවිල, කන්තලේ, කින්නියා සහ මුතූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අයත් මහවැලි ගඟ ආශ්‍රිත පහත් බිම් ප්‍රදේශවල මහ ගංවතුර තත්ත්වය අධි ගංවතුර තත්ත්වයක් දක්වා ඉහල යනු ඇත. එම නිසා එම ප්‍රදේශවල මහවැලි ගඟට ආසන්නව පදිංචි මහජනතාව ඒ සම්බන්ධව ඉතා දැඩි විමසිල්ලෙන් පසුවන ලෙසත්, ඇතිවන අධි ගංවතුර තත්ත්වයකින් ආරක්ෂාවීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ. ගංඟාව දෙපස පහත් බිම්වල වෙසෙන ජනයා හැකි ඉක්මනින් ඉන් ඉවත්වීම වඩාත් සුදුසු වේ. මේ සම්බන්ධව අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමනාකරණ අංශවලින් ඉල්ලා සිටිනු ලැබේ.**

**දැදුරු ඔය ද්‍රෝණිය සඳහා ගංවතුර අවදානම් නිවේදනය 2025.11.29 දින 1230 පැයට (2025.12.01 දින 1230 පැය දක්වා)**

**Time :- 12.30 PM**
**වේලාව :- ප.ව.12.30**

2025.12.01 දින ප.ව 12.30 දක්වා වලංගුවේ.
Valid till 12.30 PM on 01st of December 2025

| | | |
|---|---|---|
| ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන : | අංක - 06 | වර්ණය - රතු |
| **Flood Warning Message :** | **Number - 06** | Colour – Red |

## දැදුරු ඔය ද්‍රෝණිය - Deduru Oya Basin

මගේ අංක DI/Hydro/103(V) හා 2025.11.27 දින ප.ව.12.30 ට දැදුරු ඔය ද්‍රෝණිය සඳහා නිකුත් කල ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන අංක 05 න් සඳහන් කළ අනතුරු ඇඟවීම ඉදිරි පැය 48 සඳහා ද දීර්ඝ කරනු ලැබේ. **එබැවින් එම ප්‍රදේශවල පදිංචි මහජනතාවගෙන් ඒ සම්බන්ධව දැඩි විමසිල්ලෙන් පසුවන ලෙසත්, ඇතිවිය හැකි ගංවතුර තත්ත්වයකින් ආරක්ෂාවීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ. මේ සම්බන්ධව අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමණාකරන අංශවලින් ඉල්ලා සිටිනු ලැබේ.**

**මහ ඔය ද්‍රෝණිය සඳහා ගංවතුර අවදානම් නිවේදනය 2025.11.29 දින 0830 පැයට (2025.12.01 දින 0830 පැය දක්වා)**

2025.12.01 දින පෙ.ව 8.30 දක්වා වලංගුවේ.
Valid till 8.30 AM on 01st of December 2025

**Time :- 8.30 AM**
**වේලාව :- පෙ.ව. 8.30**

| | | |
|---|---|---|
| ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන : | අංක - 04 | වර්ණය - රතු |
| **Flood Warning Message :** | **Number - 04** | Colour – Red |

## අධි අවදානම් ගංවතුර අනතුරු ඇඟවීම - Critical Flood Warning
## මහ ඔය ද්‍රෝණිය - Maha Oya Basin

මහ ඔය ද්‍රෝණියේ ඉහළ ධාරා ප්‍රදේශවල බොහෝ ස්ථානවලට පසුගිය පැය 24 තුළද අධික වර්ෂාපතනයක් ලැබී පවතී. එම වර්ෂා තත්ත්වය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් මහ ඔය ද්‍රෝණිය තුළ නඩත්තු කරනු ලබන ගංගා ජල මාපක වල ජල මට්ටම් විශ්ලේෂණය අනුව මේ මොහොතේ සිට ඉදිරි පැය 24 ක කාලය තුළ මහ ඔය නිම්නයේ පහත්බිම් ප්‍රදේශවලට මෑත ඉතිහාසයේ ඇති නොවුණු මට්ටමේ **අධි අවදානම් ගංවතුර තත්ත්වයක්** ඇතිවිය හැකි බවට අනතුරු අඟවනු ලැබේ. මේ තත්ත්වයෙන් ජීවිත ආරක්ෂා කර ගැනීම පිණිස දැඩි සැලකිල්ලෙන් කටයුතු කරන ලෙසත්, ඔබට හැකි උපරිම ආරක්ෂිත ස්ථානයක් කරා හැකි ඉක්මනින් ළඟාවන ලෙසත් එම ප්‍රදේශවල පදිංචි මහජනතාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ. මේ සම්බන්ධයෙන් ඉතා වැදගත් කොට සලකා අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමනාකරණ අංශ වලින් ඉල්ලා සිටිනු ලැබේ.

**ගල් ඔය ද්‍රෝණිය සඳහා ගංවතුර අවදානම් නිවේදනය 2025.11.28 දින 1230 පැයට (2025.11.30 දින 1230 පැය දක්වා)**

**Time :- 12.30 PM**
**වේලාව :- ප.ව.12.30**

2025.11.30 දින ප.ව 12.30 දක්වා වලංගුවේ.
Valid till 12.30 PM on 30th of November 2025

| | | |
|---|---|---|
| **ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන :** | **අංක - 02** | **වර්ණය - රතු** |
| **Flood Warning Message :** | **Number - 02** | Colour – Red |

## ගල් ඔය ද්‍රෝණිය - Gal Oya Basin

මගේ අංක DI/Hydro/103(V) හා 2025.11.26 දින පෙ.ව.11.45 ට ගල් ඔය ද්‍රෝණිය සඳහා නිකුත් කල ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන අංක 01 න් සඳහන් කළ අනතුරු ඇඟවීම ඉදිරි පැය 48 සඳහා ද දීර්ඝ කරනු ලැබේ. **එබැවින් එම ප්‍රදේශවල පදිංචි මහජනතාවගෙන් ඒ සම්බන්ධව දැඩි විමසිල්ලෙන් පසුවන ලෙසත්, ඇතිවිය හැකි ගංවතුර තත්ත්වයකින් ආරක්ෂාවීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ. මේ සම්බන්ධව අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමණාකරන අංශවලින් ඉල්ලා සිටිනු ලැබේ.**

**කැළණි ගඟ ද්‍රෝණිය සඳහා ගංවතුර අවදානම් නිවේදනය 2025.11.30 දින 1800 පැයට (2025.12.02 දින 1800 පැය දක්වා)**

2025.12.02 දින ප.ව 6.00 දක්වා වලංගුවේ.
Valid till 6.00 PM on 02nd of December 2025

**Time :- 6.00 PM**
**වේලාව :- ප.ව.6.00**

| | | |
|---|---|---|
| **ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන :** | **අංක - 04** | **වර්ණය - රතු** |
| **Flood Warning Message :** | **Number - 04** | Colour – Red |

## කැළණි ගංගා ද්‍රෝණිය - களனிகங்கை படுக்கை - Kelani River Basin

මගේ අංක DI/Hydro/103(V) හා 2025.11.28 දින ප.ව.1.00 ට කැළණි ගංගා ද්‍රෝණිය සඳහා නිකුත් කල ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන අංක 03 න් සඳහන් කළ අනතුරු ඇඟවීම ඉදිරි පැය 48 සඳහා ද දීර්ඝ කරනු ලැබේ. **එබැවින් එම ප්‍රදේශවල පදිංචි මහජනතාවගෙන් ඒ සම්බන්ධව දැඩි විමසිල්ලෙන් පසුවන ලෙසත් ගංවතුර තත්ත්වයෙන් ආරක්ෂාවීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ. මේ සම්බන්ධව අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමණාකරන අංශවලින් ඉල්ලා සිටිනු ලැබේ.**

**මුරුදෙනි ඇරු ද්‍රෝණිය සඳහා ගංවතුර අවදානම් නිවේදනය 2025.11.28 දින 1230 පැයට (2025.11.30 දින 1230 පැය දක්වා)**

2025.11.30 දින ප.ව 12.30 දක්වා වලංගුවේ.
Valid till 12.30 PM on 30th of November 2025

| | | |
|---|---|---|
| **ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන :** | **අංක - 02** | **වර්ණය - ඇම්බර්** |
| **Flood Warning Message :** | **Number - 02** | Colour – Amber |

## මුන්දෙනි ආරු ද්‍රෝණිය - Mundeni Aru Basin

මගේ අංක DI/Hydro/103(V) හා 2025.11.26 දින පෙ.ව.10.00 ට මුන්දෙනි ආරු ද්‍රෝණිය සඳහා නිකුත් කල ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන අංක 01 න් සඳහන් කළ අනතුරු ඇඟවීම ඉදිරි පැය 48 සඳහා ද දීර්ඝ කරනු ලැබේ. **එබැවින් එම ප්‍රදේශවල පදිංචි මහජනතාවගෙන් ඒ සම්බන්ධව දැඩි විමසිල්ලෙන් පසුවන ලෙසත්, ඇතිවිය හැකි ගංවතුර තත්ත්වයකින් ආරක්ෂාවීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ. මේ සම්බන්ධව අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමණාකරන අංශවලින් ඉල්ලා සිටිනු ලැබේ.**

**කළු ගඟ ද්‍රෝණිය සඳහා ගංවතුර අවදානම් නිවේදනය 2025.11.30 දින 0900 පැයට (2025.12.02 දින 0900 පැය දක්වා)**

**Time :- 9.00 AM**
**වේලාව :- පෙ.ව. 9.00**

2025.12.02 දින පෙ.ව 9.00 දක්වා වලංගුවේ.
Valid till 9.00 AM on 2nd of December 2025

| | | |
|---|---|---|
| **ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන :** | **අංක - 03** | වර්ණය - ඇම්බර් |
| **Flood Warning Message :** | **Number - 03** | Colour – Amber |

## කළු ගඟ ද්‍රෝණිය - Kalu River Basin

**කළු ගඟ ද්‍රෝණිය තුළ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් නඩත්තු කරනු ලබන ජලමාපකවල වර්තමාන දත්ත විශ්ලේෂණය අනුව කළුතර දිස්ත්‍රික්කයේ කළුතර, ඉංගිරිය, හොරණ, දොඩන්ගොඩ, මිල්ලනිය, බුලත්සිංහල, පාලින්දනුවර, මදුරාවල, අගලවත්ත** යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල කළු ගඟ පිටාර තැන්නට අයත් පහත් බිම් ප්‍රදේශවලට බලපා ඇති ගංවතුර තත්ත්වය ඉදිරියේදී සැලකිය යුතු ගංවතුර තත්ත්වයක් දක්වා වර්ධනය වන බවට මෙයින් අනතුරු අඟවනු ලැබේ. මෙම තත්ත්වය සම්බන්ධයෙන් දැඩි අවධානයකින් කටයුතු කරන ලෙස එම ප්‍රදේශවල පදිංචි මහජනතාවගෙන් සහ එම ප්‍රදේශ හරහා ගමන් ගන්නා රියදුරන් හා මගීන්ගෙන්ද ඉල්ලා සිටිනු ලැබේ. මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමනාකරණ අංශ වලින් ද ඉල්ලා සිටිනු ලැබේ.

**කාලගුණ නිවේදනය 2025.11.30 දින 1600 පැයට**

**2025 දෙසැම්බර් මස 01 දිනය සඳහා කාලගුණ අනාවැකිය**
**2025 නොවැම්බර් මස 30 දින ප.ව. 2.00 ට නිකුත්කරන ලදී.**

**"දිට්වා" [Ditwah] සුළිකුණාටුව කන්කසන්තුරය සිට 210 km ක් ඊසාන දෙසින්, අක්ෂාංශ 11.4°N සහ දේශාංශ 80.6°E ආසන්නයේ කේන්ද්‍රගතව වී ඇත. මෙම පද්ධතිය තවදුරටත් දිවයිනෙන් ඉවතට, උතුරු දෙසට ගමන් කරනු ඇත. මෙම පද්ධතිය උතුරු දෙසට ගමන් කර ඉදිරි පැය 24 තුල ඉන්දියාවේ තමිල්නාඩු වෙරළ තීරයට සමාන්තරව ගමන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. දිවයිනේ කාලගුණය කෙරෙහි මෙම සුළිකුණාටුවේ බලපෑම තවදුරටත් අඩු වෙමින් පවතී.**

උතුරු, බස්නාහිර සහ සබරගමුව පළාත්වලත් ගාල්ල, මාතර, මහනුවර සහ නුවරඑළිය දිස්ත්‍රික්කවලත් වැසි වාර කිහිපයක් ඇති වේ.

ඌව පළාතෙත් මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්කවලත් පස්වරු 2.00 න් පමණ පසු ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක.

උතුරු පළාතේ විටින් විට හමන **පැ.කි.මී. 50** දක්වා වන තරමක තද සුළං ඇතිවිය හැක.

**ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මගින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

## 2025.11.30 දින 1830 පැයට ප්‍රධාන ගංගා ආශ්‍රිත ජල මට්ටම්

### Islandwide Water Level & Rainfall Situation in Major Rivers

**DATE :** 30-Nov-2025 **TIME :** 6:30 PM

| River Basin | Tributory/River | Gauging Station | | | | | Water Level at 5:00 pm | Water Level at 6:00 pm | Remarks | Water Level Rising or Falling | 9 Hr RF in mm at 6.00 pm |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | Station | Unit | Alert Level | Minor Flood Level | Major Flood Level | | | | | |
| Kelani Ganga (RB 01) | Kelani Ganga | Nagalagam Street | ft | 4.00 | 5.00 | 7.00 | 7.55 | 7.60 | Major Flood | Rising | - |
| | Kelani Ganga | Hanwella | m | 7.00 | 8.00 | 10.00 | 10.55 | 10.51 | Major Flood | Falling | 0.0 |
| | Kelani Ganga | Glencourse | m | 15.00 | 16.50 | 19.00 | 16.48 | 16.25 | Alert | Falling | 0.0 |
| | Kelani Ganga | Kithulgala | m | 3.00 | 4.00 | 6.00 | 2.59 | 2.55 | Normal | | 0.0 |
| | Gurugoda Oya | Holombuwa | m | 3.00 | 3.40 | 5.00 | 1.67 | 1.81 | Normal | | 0.0 |
| | Seethawaka Ganga | Deraniyagala | m | 4.80 | 5.80 | 6.40 | 1.50 | 1.54 | Normal | | 0.0 |
| | Kehelgamu Oya | Norwood | m | 1.50 | 3.00 | 4.50 | 1.40 | 1.38 | Normal | | 0.0 |
| Kalu Ganga (RB 03) | Kalu Ganga | Putupaula | m | 3.00 | 4.00 | 5.00 | 4.27 | 4.28 | Minor Flood | Rising | 0.0 |
| | Kalu Ganga | Ellagawa | m | 10.00 | 10.70 | 12.20 | NA | NA | | | 0.0 |
| | Kalu Ganga | Rathnapura | m | 5.20 | 7.50 | 9.50 | 6.63 | 6.57 | Alert | Falling | 0.0 |
| | Maguru Ganga | Magura | m | 4.00 | 6.00 | 7.50 | 2.99 | 2.89 | Normal | | 0.0 |
| | Kuda Ganga | Kalawellawa (Millakanda) | m | 5.00 | 6.50 | 8.00 | 7.80 | 7.78 | Minor Flood | Falling | 0.0 |
| Gin Ganga (RB 09) | Gin Ganga | Baddegama | m | 3.50 | 4.00 | 5.00 | 2.44 | 2.41 | Normal | | 0.0 |
| | Gin Ganga | Thawalama | m | 4.00 | 6.00 | 7.50 | 2.18 | 2.16 | Normal | | 0.0 |
| Nilwala Ganga (RB 12) | Nilwala Ganga | Thalgahagoda | m | 1.40 | 1.70 | 2.80 | 1.22 | 1.16 | Normal | | 0.0 |
| | Nilwala Ganga | Panadugama | m | 5.00 | 6.00 | 7.50 | 3.66 | 3.64 | Normal | | 0.0 |
| | Nilwala Ganga | Pitabeddara | m | 4.00 | 5.00 | 6.50 | 1.21 | 1.21 | Normal | | 0.0 |
| | Urubokka Ganga | Urawa | m | 2.50 | 4.00 | 6.00 | 0.84 | 0.83 | Normal | | 0.0 |
| Walawe Ganga (RB 18) | Walawe Ganga | Moraketiya | m | 3.00 | 5.00 | 7.00 | 1.74 | 1.74 | Normal | | 0.0 |
| Kirindi Oya (RB 22) | Kirindi Oya | Thanamalwila | m | 4.00 | 5.00 | 5.50 | 1.75 | 1.74 | Normal | | 0.0 |
| | Kirindi Oya | Wellawaya | m | 4.40 | 5.40 | 5.90 | 1.22 | 1.22 | Normal | | 0.0 |
| | Kuda Oya | Kuda Oya | m | 6.90 | 8.40 | 8.80 | 2.01 | 2.00 | Normal | | 0.0 |
| Menik Ganga (RB 26) | Menik Ganga | Katharagama | m | 4.00 | 4.60 | 6.50 | 0.95 | 0.95 | Normal | | 0.0 |
| Kumbukkan Oya (RB 31) | Kumbukkan Oya | Nakkala | m | 5.00 | 6.00 | 7.50 | 1.78 | 1.77 | Normal | | 0.0 |
| Heda Oya (RB 36) | Heda Oya | Siyambalanduwa | m | 4.50 | 6.00 | 7.00 | 1.37 | 1.36 | Normal | | 0.0 |
| Maduru Oya (RB 54) | Maduru Oya | Padiyathalawa | m | 4.00 | 4.50 | 6.00 | NA | NA | | | 0.0 |
| Mahaweli Ganga (RB 60) | Mahaweli Ganga | Manampitiya | m | 3.00 | 4.30 | 6.00 | NA | NA | | | - |
| | Mahaweli Ganga | Weraganthota | m | 5.00 | 6.00 | 8.00 | NA | NA | | | - |
| | Mahaweli Ganga | Peradeniya | m | 5.00 | 7.00 | 9.00 | NA | NA | | | - |
| | Mahaweli Ganga | Nawalapitiya | m | 3.50 | 5.00 | 6.00 | NA | NA | | | - |
| | Badulu Oya | Thaldena | m | 3.00 | 4.00 | 5.00 | NA | NA | | | - |
| Yan Oya (RB 67) | Yan Oya | Horowpothana | m | 6.00 | 7.50 | 10.50 | 5.53 | 5.51 | Normal | | 0.0 |
| Maa Oya (RB 69) | Mukunu Oya | Yaka Wewa | m | 4.00 | 5.00 | 6.00 | 4.18 | 1.46 | Normal | | - |
| Malwathu Oya (RB 90) | Malwathu Oya | Thanthirimale | m | 5.00 | 6.80 | 7.80 | 10.90 | 10.86 | Major Flood | Falling | 0.0 |
| Mee Oya (RB 95) | Mee Oya | Galgamuwa | m | 4.84 | 5.94 | 8.00 | NA | NA | | | - |
| Deduru Oya (RB 99) | Deduru Oya | Moragaswewa | m | 4.75 | 6.00 | 7.00 | NA | NA | | | - |
| Maha Oya (RB 102) | Maha Oya | Badalgama | m | 5.00 | 6.20 | 9.60 | 7.72 | 6.80 | Minor Flood | Falling | 0.0 |
| | Maha Oya | Giriulla | m | 5.50 | 6.50 | 7.50 | 4.05 | 4.00 | Normal | | 0.0 |
| Attanagalu Oya (RB 103) | Attanagalu Oya | Dunamale | m | 3.30 | 4.40 | 5.50 | 5.00 | 4.99 | Minor Flood | Falling | 0.0 |

**නායයෑම් පිළිබඳ අවවාදත්මක නිවේදනය 2025.11.29 දින 1600 පැයට (2025.12.01 දින 1600 පැය දක්වා )**

| දිස්ත්‍රික්කය | විමසිලිමත් මට්ටම (කහ) | අවදානම් මට්ටම (ඇම්බර්) | ඉවත්වීම (රතු) |
|---|---|---|---|
| බදුල්ල | | | මීගහකිවුල, හාලි ඇල, වැලිමඩ, ඌව පරණගම, කන්දකැටිය, ලුණුගල, බණ්ඩාරවෙල, සොරණතොට, පස්සර, බදුල්ල, ඇල්ල, හල්දුම්මුල්ල, හපුතලේ |
| කොළඹ | හෝමාගම, කැස්බෑව, කඩුවෙල, මහරගම | | පාදුක්ක, සීතාවක |
| ගාල්ල | | තවලම, නෙළුව | |
| ගම්පහ | මීරිගම, දොම්පේ, බියගම, දිවුලපිටිය | අත්තනගල්ල | |
| කළුතර | වලල්ලාවිට, මතුගම, අගලවත්ත, පාලින්දනුවර | හොරණ, බුලත්සිංහල, ඉංගිරිය | |
| මහනුවර | | | උඩුදුම්බර, මිනිපේ, දොළුව, මැදදුම්බර, පාතහේවාහැට, ගඟඉහල කොරලේ, උඩපලාත, දෙල්තොට, ගඟවටකෝරලේ, අකුරණ, උඩුනුවර, යටිනුවර, පාතදුම්බර, තුම්පනේ, පස්බාගේකොරලේ, පන්විල, හාරිස්පත්තුව, පූජාපිටිය, කුණ්ඩසාලේ, හතරලිද්ද |
| කෑගල්ල | | | රඹුක්කන, අරණායක, මාවනැල්ල, බුලත්කොහුපිටිය, කෑගල්ල, වරකාපොල, ගලිගමුව, රුවන්වැල්ල, යටියන්තොට, දැරනියගල, දෙහිඕවිට |
| කුරුණෑගල | | | මල්ලවපිටිය, මාවතගම, රිදීගම, නාරම්මල, අලව්ව, පොල්ගහවෙල |
| මාතලේ | | | යටවත්ත, විල්ගමුව, අඹන්ගඟ කෝරලේ, උකුවෙල, රත්තොට, නාඋල, පල්ලෙපොල, ලග්ගල පල්ලේගම, මාතලේ, උකුවෙල |
| මොණරාගල | බඩල්කුඹුර, වැල්ලවාය | බිබිල, මැදගම | |
| නුවරඑළිය | | | වලපනේ, හඟුරන්කෙත, නිල්දණ්ඩාහින්න, මතුරට නුවරඑළිය, කොත්මලේ නැගෙනහිර, කොත්මලේ බටහිර, තලවකැලේ, අඹගමුව, නෝර්වුඩ් |
| රත්නපුර | වැලිගෙපොල, කොටපොල, ඇඹිලිපිටිය | **කිරිඇල්ල, ඇහැලියගොඩ, කුරුවිට, රත්නපුර, පැල්මඩුල්ල, ගොඩකවෙල, ඕපනායක,** ඇලපාත, ඉඹුල්පෙ, කලවාන, කොලොන්න, කහවත්ත , බලංගොඩ | |

*(මූලාශ්‍ර - NBRO)*

## ප්‍රධාන ජලාශ ආශ්‍රිත වාන් දොරටු විවෘත කිරීම ( 2025.11.30 දින 1800 පැයට )

| අනු අංකය | දිස්ත්‍රික්කය | ජලාශය | විවෘත කර ඇති වාන් දොරටු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අනුරාධපුරය | රාජාංගනය | වාන්දොරටු 12 අඩි 06 බැගින් විවෘතකර ඇත.<br>වාන්දොරටු 04 අඩි 05 බැගින් විවෘතකර ඇත.<br>වාන්දොරටු 02 අඩි 04 බැගින් විවෘතකර ඇත. |
| 02 | | අංගමුව | වාන්දොරටු 02 අඩි 06 බැගින් විවෘතකර ඇත. |
| 03 | | කලාවැව | වාන්දොරටු 02 අඩි 14 බැගින් විවෘතකර ඇත. |
| 04 | කුරුණෑගල | දැදුරු ඔය | වාන්දොරටු 08 අඩි 05 බැගින් ද විවෘතකර ඇත. |
| 05 | මහනුවර | පොල්ගොල්ල | වාන්දොරටු 03 අඩි 02 අඟල් 06 බැගින් විවෘතකර ඇත. |
| 06 | මොණරාගල | වෙහෙරගල | වාන්දොරටු 02 අඩි 01 බැගින්ද<br>වාන්දොරටු 04 අඟල් 06 බැගින් ද විවෘතකර ඇත. |
| 07 | මාතලේ | බෝවතැන්න | වාන්දොරටු 06 අඩි 03 බැගින් විවෘතකර ඇත. |
| 08 | මහනුවර | රන්ටැඹේ | වාන්දොරටු 02 මීටර් 2 ½ බැගින් විවෘතකර ඇත. |
| 09 | බදුල්ල | උල්හිටිය - රත්කිඳ | වාන්දොරටු 07 අඩි 01 බැගින් විවෘතකර ඇත. |
| 10 | කළුතර | කුකුලේගඟ | වාන්දොරටු 01 තත්.ඝන මීටර් 30 බැගින් විවෘතකර ඇත. |
| 11 | හම්බන්තොට | ලුණුගම්වෙහෙර | වාන්දොරටු 06 අඩි 01 අඟල් 04 බැගින් විවෘතකර ඇත. |

*(මූලාශ්‍ර - අදාළ වාරි ඉංජිනේරු කාර්යාල)*

- **වැදගත් - ඉහත සඳහන් ජලාශ හා වැව් වලට අමතරව දිවයිනේ ප්‍රධාන ජලාශ හා වැව් රැසක වාන් දොරටු විවෘත කර තිබේ.**

## 2025.11.30 දින 1800 පැයට මාර්ග ජලයෙන් යටවී ඇති ස්ථාන

❖ අම්පාර දිස්ත්‍රික්කය

- ➢ අලයඩිවෙම්බු ප්‍රා.ලේ. කොට්ඨාශයේ අක්කරෙයි පත්තු - කන්ජන්කුඩා ප්‍රධාන මාර්ගය සහම කෝස්වුව අසලින් අඩි 2 ½ පමණ යටවී ඇත. මාර්ගය වසා ඇත.
- ➢ සමන්තුරේ ප්‍රා.ලේ. කොට්ඨාශයේ අම්පාර - කරෙයිතිව් ප්‍රධාන මාර්ගය වලතපිඩ්ඩි යන ස්ථානයේ අඩි 02 ක් පමණ ජලයෙන් යටවී ඇත.
- ➢ අම්පාර ප්‍රා.ලේ. කොට්ඨාශයේ අම්පාර - ඉඟිනියාගල ප්‍රධාන මාර්ගය කොන්ඩුවෙඩ්ඩුවාන් කෝස්වුව අසලින් අඩි 1 ½ පමණ ජලයෙන් යටවී ඇත.
- ➢ කරයිතිව් ප්‍රා.ලේ. කොට්ඨාශයේ කල්මුණේ - අම්පාර ප්‍රධාන මාර්ගය මාවඩිපිල්ලි කෝස්වුව අසලින් අඩි 02 පමණ ජලයෙන් යටවී ඇත.
- ➢ නවිතන්වේලි ප්‍රා.ලේ. කොට්ඨාශයේ කිඩන්ගි පාලම අසලින් අඩි 03 ක් පමණ ජලයෙන් යටවී ඇත. මාර්ගය වසා ඇත.
- ➢ පොතුවිල් ප්‍රා.ලේ. කොට්ඨාශයේ පොතුවිල් - ලාහුගල ප්‍රධාන මාර්ගයේ 02 වන සැතපුම් කණුව අසල අඩි 1 ½ පමණ ජලයෙන් යටවී ඇත.

❖ මොණරාගල දිස්ත්‍රික්කය

- ➢ සියඹලාණ්ඩුව ප්‍රා.ලේ.කො. කෝන්ගස්පිටිය ග්‍රා.නි. වසමේ සුගලාදේවී වැවේ පිටවාන වන කෝස්වුව හා පුස්කිවුල කෝස්වුව ජලයෙන් යටවී ගමනාගමනයට බාධා සිදුව ඇත.
- ➢ මඩුල්ල ප්‍රා.ලේ.කොට්ඨාශයේ මාරි අරාව ග්‍රා.නි. වසමේ යමින් ආර සහ ගංගොඩආර පිටාර ගැලීමෙන් ගමනාගමනයට බාධා සිදුව ඇත.

❖ අනුරාධපුර දිස්ත්‍රික්කය

- ➢ කැකිරාව ප්‍රා.ලේ. කොට්ඨාශයේ කැකිරාව - හඳුන්ගම හරහා ගල්නෑව මාර්ගය අඩි 02 1/2 ක් ජලයෙන් යටවී ගමනාගමනයට බාධා සිදුව ඇත.
- ➢ කැකිරාව ප්‍රා.ලේ. කොට්ඨාශයේ අවුකන හරහා කලාවැව මාර්ගය අඩි 02ක් ජලයෙන් යට වී ගමනාගමන බාධා සිදුවිය ඇත.
- ➢ පදවිය ප්‍රා.ලේ. කොට්ඨාශයේ බුද්ධංගල ග්‍රා.නි. වසමේ වැළි ඇල සපත්තු පාලම හා වව්නියා පරාක්‍රමපුර මා ඔය සපත්තු පාලම හරහා අඩි 03ක් පමණ ජලයෙන් යටවී ඇත.

- රාජාංගනය පාදේශීය ලේකම් කාර්යලය ඉදිරිපිට ප්‍රධාන මාර්ගය කැඩී ගොස් ඇත. ගමනගමනය කල නොහැක.

❖ පොලොන්නරුව දිස්ත්‍රික්කය
- සෝමවති විහාරස්ථානයට ගමන්ගන්නා මාර්ගයේ කොටසක් අඩි 01ක පමණ ජල මට්ටක් පවතින අතර, පවතින අධික වර්ෂාවත් සමඟ ජලමට්ටම ඉහලයා හැකි බැවින් ප.ව 5.00න් පසු නැවත දැනුම්දෙන තුරු සියළු වාහන ගමන්කිරීම තාවකාලිකව නතර බව දැනුම් දී ඇත.
- පොලොන්නරුව මඩකලපුව ප්‍රධාන මාර්ගය (ගල් ලැල්ලේ සිට මනම්පිටිය දක්වා ) පෙ.ව 2.45 සිට සියළුම වාහන සඳහා නතර කර ඇත.

❖ පුත්තලම දිස්ත්‍රික්කය
- පුත්තලම - කොළඹ මාර්ගයේ වෙන්නප්පුව සිට පුත්තලම දක්වා මාර්ගය වසා ඇත.
- පුත්තලම අනුරාධපුර මාර්ගය සාලියවැව හංදිය කලා ඔය පාලම මාර්ගය.

❖ ගම්පහ දිස්ත්‍රික්කය
- කොළඹ - කුරුණෑගල අංක 5 මාර්ගය කොටදෙණියාව ප්‍රදේශයෙන් ජලයෙන් යටවීම නිසා වාහන ගමනාගමනය නතරවී ඇත.

❖ බදුල්ල දිස්ත්‍රික්කය
- මහියංගනය මාර්ගයේ 8 කණුව ප්‍රදේශයේ පාලම කැඩී ඇති බැවින් මාර්ගය අවහිර වී ඇත.
- පස්සර බදුල්ල මාර්ගය නායයෑම් හේතුවෙන් අවහිර වී ඇත.
- මඩොල්සිම - මැටිගහතැන්න මාර්ගය
- රේන්දපොල- අඹේවෙල
- පේරාදෙණිය- බදුල්ල-වෙන්කලඩි
- නුවරඑළිය- උඩුපුස්සල්ලාව
- දික්වැල්ල - ජංගුල්ල - තල්පිටිගල
- පේරාදෙණිය-බදුල්ල-වෙන්කලඩි
- පස්සර - මඩොල්සිම - මැටිගහතැන්න
- පේරාදෙණිය-බදුල්ල-වෙන්කලඩි
- පේරාදෙණිය-බදුල්ල-වෙන්කලඩි
- බණ්ඩාරවෙල-ලියංගහවෙල-පුනාගල
- බදුල්ල - කරමැටිය - ආඳාඋල්පොත
- ඇල්ල- පස්සර

**2025.11.30 දින 1800 පැයට බෝට්ටු හා හට පිරිස් ස්ථානගත කිරීම්**

| දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. කාර්යාලය | යොදවා ඇති ස්ථානය | ස්ථානගත කිරිම |
|---|---|---|---|
| ගාල්ල | තවලම | අශෝකාරාමය - තවලම | නාවික හමුදාවේ 01 X 10 හට පිරිසක් සහ OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | නාගොඩ | නාගොඩ ප්‍රා.ලේ. කාර්යාලය | නාවික හමුදාවේ 01 X 05 හට පිරිසක් සහ OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | | විද්‍යාතිලක පිරිවෙන - නාගොඩ | නාවික හමුදාවේ 01 X 05 හට පිරිසක් සහ OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | නෙළුව | සුදර්ශනාරාමය - නෙළුව | යුද්ධ හමුදාවේ 01 X 16 හට පිරිසක් සමඟ OBM 01, ඩිංගි 01 ක් ස්ථානගත කර ඇත. |
| මාතර | අතුරලිය | පානදුගම | යුද්ධ හමුදාවේ (3 ගැහේබ) 01 x 05 හට පිරිසක් යුනි බෆල් රථ 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | කඹුරුපිටිය | කඹුරුපිටිය පොලිසිය | යුද්ධ හමුදාවේ (9 ශ්‍රීලංසිරෙ) 01x 05 හට පිරිසක් යුනි බෆල් රථ 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| රත්නපුර | රත්නපුර | නව නගරය - රත්නපුර | නව නගරයේ නාවික හමුදාවේ 03 ක හට පිරිසක් OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| කෑගල්ල | වරකපොළ | වරකපොළ | නාවික හමුදාවේ 01x03 ක හට පිරිසක් OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| අනුරාධපුරය | අනුරාධපුරය | අනුරාධපුරය | නාවික හමුදාවේ 01x03 ක හට පිරිසක් OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | ඉපලෝගම | | නාවික හමුදාවේ 01x03 ක හට පිරිසක් OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | තඹුත්තේගම | තඹුත්තේගම පොලිසිය | නාවික හමුදාවේ 01x03 ක හට පිරිසක් OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | ගල්නෑව | ගල්නෑව පොලිසිය | නාවික හමුදාවේ 01x03 ක හට පිරිසක් OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | සෙට්ටිකුලම | | නාවික හමුදාවේ 01x03 ක හට පිරිසක් OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | මැදවච්චිය | මැදවච්චිය නගරය | නාවික හමුදාවේ 01x03 ක හට පිරිසක් OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| පුත්තලම | රස්නායකපුර | | නාවික හමුදාවේ 01x03 ක හට පිරිසක් OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | පරණ එළුවන්කුලම | | නාවික හමුදාවේ 01x03 ක හට පිරිසක් OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | පල්ලම | | නාවික හමුදාවේ 01x03 ක හට පිරිසක් OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | ආරච්චිකට්ටුව | | නාවික හමුදාවේ 01x03 ක හට පිරිසක් OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | ආනමඩුව | | නාවික හමුදාවේ 01x03 ක හට පිරිසක් OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | පුත්තලම | පුත්තලම නගරය | නාවික හමුදාවේ 01x03 ක හට පිරිසක් OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | වාරියපොළ | | නාවික හමුදාවේ 01x03 ක හට පිරිසක් OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| | කරුවලගස්වැව | | නාවික හමුදාවේ 01x03 ක හට පිරිසක් OBM 01, ඩිංගි 01 ක් සමඟ ස්ථානගත කර ඇත. |
| මහනුවර | මහනුවර | මහනුවර නගරය | ගුවන් හමුදා සෙබළු 02කු  බෝට්ටු 01 සමඟ 2SR කඳවුරේ ස්ථාගනගත කර ඇත. |

- *සටහන - වාර්තා නොවූ කණ්ඩායම් රැසක් මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබයි*

කේ.ජී.මහේන්ද්‍ර ජගත්
නියෝජ්‍ය අධ්‍යක් / රාජකාරි භාර නිළධාරී
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය